---

මාතලේ ප්‍රාදේශීය සභාව

මාතලේ දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

---

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතලේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

(අ). සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ජල ගාස්තු ආදායම රු.6,597,889ක් වුවද, එය රු.8,295,732ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජල විකුණුම් ආදායම හා දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තුව රු.1,697,843ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(ආ). ඉකුත් වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු මුද්දර ගාස්තු ආදායම වූ රු.407,150ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ). බදුදීම සඳහා ඉදිකරන ගොඩනැගිලි වෙනුවෙන් බදු ගැනුම්කාර පාර්ශවයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ එකවර අයකළ යුතු රු.220,000ක් හා බිම් කුලී රු.2,900ක් වර්ෂයට අදාළ ආදායම් ලෙස හා දෙසැම්බර් 31 දිනට ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණු වටිනාකම රු.42,500ක් වූ පරිගණක මේස 05ක් හා වටිනාකම රු.63,825ක් වූ යන්ත්‍ර හා උපකරණ විෂයයන් 37 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ). ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි උපලේඛනයේ ඇතුළත් ගොඩනැගිලි විෂයයන් 10ක වටිනාකම ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 04 කට පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.9,144,179 ක් විය.

(ආ). තොරතුරු ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 38,532,057ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,312,199 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,572,165 ක් විය.

2.2 මූල්‍ය පාලනය

2005 සිට 2008 වර්ෂය දක්වා අවස්ථා 05 කදී දෙන ලද රු.310,367 ක අත්තිකාරම් 2012 දෙසැම්බර් 31 දින වන විටත්, පියවා නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). වරිපනම් හා බදු | 1,275 | 1,065 | 593 |
| (ii). බදු කුලී | 4,115 | 2,163 | 18 |
| (iii).බලපත්‍ර ගාස්තු | 2,650 | 2,310 | - |
| (iv).වෙනත් ආදායම් | 28,071 | 134,071 | 14,597 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 2,724,628 |
| (ii). | මුද්දර ගාස්තු | 5,491,548 |

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂය තුළ පනවන ලද අධිභාරවලට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට රු.36,883 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 2.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

(අ). පිරිවැය රු.723,768 ක් වූ භෞතික සම්පත් විෂයයන් 15ක් හා වටිනාකම ගණනය කර නොතිබූ කැබ්රථයක් නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

(ආ). 2011 ගම නැගුම සංවර්ධන යෝජනා යටතේ රු.1,329,229ක් වැයකර ඉදිකර තිබූ පලාපත්වල සායන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිශ්කාර්යව පැවතුණි.

## 2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියෙන් ප්‍රතිපාදන සැලසී නොමැති උත්සව, සුභපැතුම් හා බැනර් යෙදීම වැනි කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී රු.150,840ක් වැයකර තිබුණි.

## 2.7 අවිධිමත් ගනුදෙනු

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2000 නොවැම්බර් 30 දිනැති අංක 7/1/2000 දරන චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව කාර්යාල කටයුතු හා අධීක්ෂණ රාජකාරි කටයුතු සඳහා සභාවේ හිටපු ලේකම්වරයාට නිවාඩු දින සේවය කිරීම වෙනුවෙන් රු.31,690 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

(ආ) නිවාඩු දිනවල සේවයෙහි යෙදීමට පෙරාතුව සභාපතිවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එබඳු විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදි රු.13,113 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. එසේම අදාල සේවය ඉටු කිරීමෙන් පසු කරන ලද රාජකාරි පිළිබඳ

විස්තරයක් ගෙවීම් වවුවරයට ඇතුළත් කර එය සළකා බැලීමෙන් පසු ගෙවීම් නිර්දේශ කළහැකි වුවත්, සිදු කරන ලද රාජකාරි පිළිබඳ ලිඛිත තහවුරුවකින් තොරව අවස්ථා 08 කදී රු.31,690 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

(ඇ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (1) වගන්තියට අනුව තනතුරක් ඇති කිරීම හා වැටුප් නියම කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද එබඳු අනුමැතියකින් තොරව සේවකයින් 39 දෙනෙකු ආදේශක පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.5,676,309ක ගෙවා තිබුණි.

## 2.8 කොන්ත්‍රාත් පරිපාලනය

2012 වර්ෂයේ විවිධ ප්‍රතිපා යටතේ සිදුකරන ලද සමහර ගොඩනැගිලි ඉදිකිරීම් සහ මාර්ග ඉදිකිරීම් නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ඉටුකර නොතිබුණු බව භෞතික පරීක්ෂණයන්හීදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| | කොන්ත්‍රාත්තුව | ප්‍රතිපාදන වර්ගය | වැයකළ මුදල<br>රු. |
|---|---|---|---|
| (i) | මඩවල පොදු වෙළඳපල කඩ කාමර ඉදිකිරීම | පොදු අරමුදල් ප්‍රතිපාදන | 2,612,899 (2013 මැයි 09 දිනට) |
| (ii) | බීරිදෙවල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | ගම නැගුම ප්‍රතිපාදන | 946,491 (2013 පෙබරවාරි 20 දිනට) |
| (iii) | අලුවිහාරේ පැරණි පාසල් මාවත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | විමධ්‍යගත ප්‍රතිපාදන | 47,780 (2012 දෙසැම්බර් 31 දිනට) |
| (iv) | බීරිදෙවල සීවලී මාවත සංවර්ධනය කිරීම | ගම නැගුම ප්‍රතිපාදන | 927,333 |

## 2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

---

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207 හා 208 රීති හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1;4:1, 3:4:1 හා 6:3:1 ඡේදවලට අනුව තරඟකාරි වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව අත්මිල ගණන් මත සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06 කදි රු.328,795 ක විදුලි උපකරණ, ජල උපකරණ හා පෙර පාසැල් නිල ඇඳුම් රෙදි මිලදීගෙන තිබුණි.

(ආ). මුදල් රෙගුලාසි 880 හා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 දරන චක්‍රලේඛයට අනුව ඇප තැබිය යුතු නිලධාරින් 19 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි.

(ඇ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුමත සැලසුම් මත ඉදිකරන ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතික ලබාදිය යුතු වුවත් 2010, 2011 හා 2012 වර්ෂවලට අදාළ අයදුම්පත් 988 ක් ලැබී, ඉන් අයදුම්පත් 788 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 36ක් සඳහා පමණක් විය.

(ඈ). මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95 / 9 මධ්‍යම පළාත් ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ පියවා ගැනීමට අවශ්‍ය පියවර අවසන් වරට නිලධාරියා සේවය කළ ආයතනය විසින් ගතයුතු වුවද, ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.114,692 ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත හා අදාල සංශෝධන අනුව අයකරනු ලබන මුද්දර ගාස්තු සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කළයුතු වුවද, 2011 අවසන් කාර්තුව තුළ හා සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් අය කරන ලද මුද්දර ගාස්තු රු.231,927 ක මුදලක් 2013 මැයි 10 දින වන විටත්, ප්‍රේෂණය කිරීමකින් තොරව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ). ගබඩා තොග 2013 මැයි 10 දින භෞතිකව පරික්ෂා කිරීමේදි රු.28,159ක් වටිනා ඒකක 26ක තොග අතිරික්තයක් සහ රු.1,370ක් වටිනා තොග ඒකක 02 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර, තොග ලේඛන කිසිදු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අයවැය පාලනය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ). වාහන පාලනය